# ආණ්ඩුවේ නිවේදන

## කන්න රැස්වීම් තීරණ ප්‍රකාශයට පත් කිරීම

මහකනදරාව මහා වාරිමාර්ග ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධන ) පනත යටතේ පිහිටුවන ලද මහකනදරාව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා **"විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටු වගා රැස්වීම"** 2020.05.19 දින රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය රැස්වීම් ශාලවේදී පැවති අතර එහිදී 2020 යල කන්නයේ වගා කටයුතු සඳහා පහත සඳහන් වගා කාලසටහන හා යෝජනා සම්මත කරන ලදී.

### 2020 යල කන්නයේ වගා කාල සටහන

1. **වගා බිම් ප්‍රමාණය**
   - I. එක් කට්ටි කරුවෙකුට අක්කර 1 ක් වන පරිදි හා ගොවි සංවිධාන සාමාජික සින්නක්කර ඉඩම් හිමියන් සඳහා උපරිමය අක්කර ½ ක් වන පරිදි බෙත්ම අතිරේක භෝග වගාව - අක්කර 2200
   - II. රඹෑව වැව පුරාණ වෙල යටතේ එක් ගොවියෙකුට උපරිම අක්කර ½ ක් වන පරිදි බෙත්ම වී වගාව- අක්කර 56
   - III. රඹෑවගම හැර අනෙකුත් ගොවි සංවිධාන බල ප්‍රදේශවල එක් කට්ටිකරුවෙකුට උපරිමය අක්කර ½ ක් වන පරිදි හා කෝන්ගස් අමුණ සින්නක්කර ඉඩම් හිමියන් සඳහා අක්කර ¼ ක් වන පරිදි බෙත්ම වී වගාව - අක්කර 1000
2. **වගා කරනු ලබන භෝගය**
   - I. අතිරේක ආහාර භෝග (සෝයා/බඩ ඉරිගු/ මුං/කව්පි/උඳු )
   - II. රඹෑවවැව පුරාණ වෙල යටතේ මාස 3 , 3 ½ වී වගාව
   - III. රඹෑවගම හැර අනෙකුත් ගොවි සංවිධාන බල ප්‍රදේශවල මාස 2 ½ , 3 වී වගාව

| අනු අංකය | කාරණය | අතිරේක ආහාර බෝග | | වී වගාව | |
|---|---|---|---|---|---|
| | | අදියර 01 | අදියර 02 | අදියර 01 | අදියර 02 |
| 03 | වගා කිරීමට යෝජිත ප්‍රදේශය | වම් ඉවුර හා දකුණු ඉවුර ගොවි සංවිධාන බල ප්‍රදේශ වල තෝරාගත් ඇල මාර්ග වල තෝරාගත් ගොඩ කුඹුරු ඉඩම් වල | | රඹෑවවැව පුරාණ වෙල යටතේ පමණක් | රඹෑවගම හැර වම් ඉවුර හා දකුණු ඉවුර ගොවි සංවිධාන බල ප්‍රදේශවල තෝරාගත් ඇල මාර්ග වල තෝරාගත් මඩ කුඹුරු ඉඩම් වල |
| 04 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව , ගොවි සංවිධාන සහ ගොවීන් විසින් ප්‍රධාන ඇල සහ බෙදුම් ඇලවල්, සහ කෙත් ඇලවල් සහ අපවහන ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020.04.20 | 2020.05.22 | 2020.04.09 | 2020.05.22 |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරන ඇලවේළි ගොවි සංවිධාන විසින් ශුද්ධ කර අවසන් කළ යුතු දිනය | 2020.04.25 | 2020.05.23 | 2020.04.09 | 2020.05.23 |
| 06 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.04.25 | 2020.05.23 | 2020.04.10 | 2020.05.23 |
| 07 | බිම් සැකසීම ආරම්භ කළ යුතු දිනය | 2020.04.25 | 2020.05.20 | 2020.04.10 | 2020.05.23 |
| 08 | වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.05.05 | 2020.05.30 | 2020.04.30 | 2020.05.30 |
| 09 | මුර ජල කාලය දින | දින 80 | දින 80 | දින 90 | දින 75 |
| 10 | මුර ජලය ආරම්භ වන දිනය | 2020.05.08 | 2020.06.03 | 2020.05.05 | 2020.06.03 |
| 11 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.07.24 | 2020.08.20 | 2020.07.30 | 2020.08.13 |
| 12 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.05.05 | 2020.05.30 | 2020.04.30 | 2020.05.30 |
| 13 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.08.20 | 2020.08.28 | 2020.08.13 | 2020.08.28 |
| 14 | අස්වනු නෙලා අවසන් කිරීමට යෝජිත දිනය | 2020.09.15 | 2020.09.30 | 2020.08.25 | 2020.09.15 |

- මෙහිදී අදියර 01 යනුවෙන් 2020.04.06 දින රඹෑව ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති කන්න රැස්වීමේ තීරණද අදියර 02 යන්නෙහි 2020.05.19 දින අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීමේ තීරණද වේ.

**සම්මත වූ අනෙකුත් නීති හා රෙගුලාසි**

1. 2020.04.10 සිට 2020.10.05 දක්වා කාලය තුළ යායට ගවයන් ඇතුළු කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.
2. කුඹුරු ඉඩම් නොවන ඉඩම් වගා කිරීම සඳහා වාරි මාර්ග ජලය කවර ආකාරයකින් හෝ ලබා ගැනීම සපුරා තහනම්ය.
3. නීත්‍යානුකූලව ලබා දී ඇති භෝගයට සහ ප්‍රමාණයට පමණක් වාරිමාර්ග ජලය නිකුත් කරන අතර වෙනත් ඉඩම්වල වගාවන් සඳහා එම වාරි ජලය කවර ආකාරයකින් හෝ ලබා ගැනීම සපුරා තහනම්ය.
4. සම්මත කරගත් දිනෙන් පසුව කවර හේතුවක් නිසාවෙන් හෝ ජලය නිකුත් කිරීම දීර්ඝ කරනු නොලැබේ.
5. නියම කර ඇති දිනට පෙර ඇල වේලි ශුද්ධ කර නොමැති නම් එම කාර්යය නිම වන තුරු එම ඇලට ජලය නිකුත් කරනු නොලැබේ. ( නියමිත දිනට ඇලවේලි ශුද්ධ කිරීම පැහැර හරින කුඹුරු හිමියන්ගෙන්, වගා කරුවන්ගෙන් බඹයකට රු.250.00 ක් බැගින් දඩ මුදලක් අය කර ගැනීමට ගොවි සංවිධානයට අවසර දෙනු ලැබේ )
6. ඇලවේලි නඩත්තු හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් වගා කරනු ලබන සෑම අක්කර 1 ක් සඳහාම රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවා ලද්දු පතක් ලබා ගත යුතුය.
7. ගොවි සංවිධානය විසින් පත් කර ඇති ජල පාලක වෙත ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ වතුර බෙදීමේ හා ඇළවේළි ආරක්ෂා කිරීමේ බලය පවරා ඇත.
8. ප්‍රධාන ඇලෙන් බෙදුම් ඇලට ජලය ලබා දීම අදාල ජල පාලන කමිටුව විසින් සකස් කරන ජල පාලන කාල සටහනට අනුව විය යුතුය.වාරි මාර්ග දොපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර මෙම කමිටුවේ සභාපති වන අතර අදාල ගොවි සංවිධාන සභාපතිවරුන් හා ජල පාලකවරුන් කමිටු සාමාජිකයින් වේ.
9. ඇලවේළි / නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංගවලට හානි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිණවීම වාරිමාර්ග ආඥා පනතේ 23 වෙනි වගන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වෙනි වගන්තිය අනුව වැරදිකරුවන් දඩුවමට ලක්වනු ඇත.
10. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ ද්‍රව්‍ය එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 84 ( 1 ) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධානයේ නියෝජිතයින් හට බලය පවරා ඇත.
11. මෙම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන ගොවි නියෝජිතයින් හෝ ජල පාලකවරුන් රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක් , ඉඩ නොදීමක් , පරිභව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම , රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරුවේ. ( ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වැනි වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 72 වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණ සළසා ඇත.
12. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වය හෝ කිසියම් පාලනය කරගත නොහැකි බාහිර උපද්‍රවයක් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති කළමණාකරන කමිටුව සතුය.
13. මෙම නිවේදනයේ යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපන බලය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

ආර්.එම්.වන්නිනායක,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.එම්. වන්නි
දිසාපති/දිස්ත්‍රි
අනුරාධපුර